ජනාධිපති කාර්යාලය
சனாதிபதி அலுவலகம்
PRESIDENTIAL SECRETARIAT

චක්‍රලේඛ අංක: SP/SB/03/10
2010 මැයි මස 31 දින

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා රාජ්‍ය ව්‍යාපාරික ආයතන ප්‍රධානීන් වෙත

**රාජ්‍ය අංශයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ භාවිතය පිළිබඳ ප්‍රතිපත්ති සහ කාර්යය පටිපාටි (ඉ-රාජ්‍ය ප්‍රතිපත්ති)**

රජය විසින් "ඉංග්‍රීසි සහ තොරතුරු තාක්ෂණ වසර" වශයෙන් නම් කරන ලද 2009 වසරේදී සිදු වූ ඉතා වැදගත් සිදුවීමක් ලෙස සලකා "රාජ්‍ය අංශයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (තො.ස.තා.) භාවිතය පිළිබඳ ප්‍රතිපත්ති සහ කාර්යය පටිපාටි (ඉ-රාජ්‍ය ප්‍රතිපත්ති)" 2009-12-16 දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කළ බැව් ඔබ වෙත දන්වනු කැමැත්තෙමි. එම ප්‍රතිපත්තියෙහි ඉංග්‍රීසි පිටපතක් ඔබගේ දැන ගැනීම සහ ආයතනයේ කටයුතු සඳහා යොදා ගැනීම සඳහා මේ සමග අමුණා එවා ඇත. මෙම ප්‍රතිපත්ති ලේඛනයේ සිංහල, ඉංග්‍රීසි සහ දමිළ පිටපත් තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ වෙබ් අඩවියෙන් (www.icta.lk) ලබා ගත හැක.

රජයට අයත් සමාගම් ද ඇතුළුව ජාතික, පළාත් සභා සහ පළාත් පාලන මට්ටමේ සියලූ රජයේ නියෝජිතායතන හා ආයතනවල 2010 ජනවාරි මස සිට මෙම ප්‍රතිපත්තිය සම්පූර්ණයෙන් ම භාවිතයට ගැනීම අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කොට ඇත. මෙම ප්‍රතිපත්තියෙහි දැක්වෙන ඉතා වැදගත් වූ කරුණු සමහරක් පහත දක්වා ඇත:

1. සෑම රාජ්‍ය ආයතනයක් ම තම ආයතනය තුළ තො.ස.තා. ඒකකයක් පිහිටුවිය යුතු වේ. එසේ ම එම ආයතනයේ තො.ස.තා. සහ ඉ-රාජ්‍ය කටයුතු භාරව ක්‍රියා කිරීම පිණිස සෑම රජයේ ආයතනයක් ම ප්‍රධාන නව්‍යකරණ නිලධාරියෙකු (Chief Innovation Officer) පත් කළ යුතු වේ.
2. තම ආයතනයේ මෙහෙවර සහ දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා තො.ස.තා. භාවිතා කර ගන්නා අයුරු පැහැදිලි ව දැක්වෙන තො.ස.තා. සැලසුමක් කෙටුම්පත් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සෑම රාජ්‍ය ආයතනයක් විසින් ම ඉටු කළ යුතු වේ. වාර්ෂික තො.ස.තා. ප්‍රසම්පාදන මෙම සැලසුමට ඇතුළත් විය යුතු වේ. තො.ස.තා. වාර්ෂික සැලසුම ආයතනයේ ප්‍රධාන ව්‍යාපාරික සැලසුමේ කොටසක් විය හැක.
3. සෑම රජයේ ආයතනයක් ම තම වාර්ෂික අයවැය මගින් ආයතනයේ තො.ස.තා. ප්‍රසම්පාදන කටයුතු සහ ආයතනයේ පවතින තො.ස.තා. උපකරණ, පද්ධති සහ ජාල නඩත්තුව සඳහා ප්‍රමාණවත් මුල්‍ය ප්‍රතිපාදන වෙන් කරවා ගත යුතු ය.
4. මෙම සම්මත වූ තො.ස.තා. භාවිතය පිළිබඳ ප්‍රතිපත්ති සහ කාර්යය පටිපාටි අනුව සියලුම රජයේ ආයතන නිල සන්නිවේදන කටයුතු සඳහා ඉ-මේල් භාවිතා කිරීම අනිවාර්ය වනු ඇත. ඒ අනුව ක්‍රමයෙන් ඉ-මේල් භාවිතා කිරීම ඇරඹීමට අවශ්‍ය කටයුතු කල් ඇතුව සූදානම් කිරීමට වග බලාගත යුතු ය.
5. සෑම රජයේ ආයතනයක් ම තම ආයතනයේ ප්‍රධාන සන්නිවේදන මෙවලමක් ලෙස "gov.lk" වසම යටතේ ලියාපදිංචි කරන ලද ත්‍රෛභාෂික වෙබ් අඩවියක් මගින් තම ආයතනයේ තොරතුරු හා සේවා සැපයීම් විස්තර පුරවැසියනට ලබා දිය යුතු ය. මෙම වෙබ් අඩවිය තො.ස.තා. නියෝජිතායතනයේ රාජ්‍ය අංශ ප්‍රතිනිර්මාණ වැඩසටහන විසින් ප්‍රසිද්ධ කොට ඇති "රාජ්‍ය අංශය සඳහා වූ වෙබ් ප්‍රමිතීන්" හා අනුගත විය යුතු ය.

→ 2

ගාලු මුවදොර, කොළඹ 01 / காலி முகத்திடல், கொழும்பு 01 / Galle Face, Colombo 01
දුරකථන / தொலைபேசி / Telephones: ++ 94 (0) 11 2354418, ++ 94 (0) 11 2473873
ෆැක්ස් / தொலைநகல் / Fax: ++ 94 11 2446657
ඉ-තැපෑල / மின்-அஞ்சல் / e-mail: prsec@presidentsoffice.lk